# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2138/19 – 2019 අගෝස්තු 27 වැනි අඟහරුවාදා – 2019.08.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර (78බී) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බදුල්ල නැගෙනහිර (කොට්ඨාස අංක 06) (බදුල්ල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/ඒසීකිව්/බීඩීඑල්/2017/117 හා 2017.09.30 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඔයවේලෝන – ප්‍රමාණය: හෙක්. 0.0126 ක් පමණ**

උතුරට: ගඟබඩ පාර සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඔයවේලෝන වත්ත; නැගෙනහිරට සහ දකුණට: බදුලු ඔය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඔයවේලෝන වත්ත; බටහිරට: ගඟබඩ පාර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/WS/508.
2019 ජනවාරි මස 03 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 329

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ

1A – G 30837 – 30 (2019/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරළේ සුළු කොට්ඨාසයේ, බදුළුපිටිය (78) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බදුළුපිටිය, කොට්ඨාස අංක 7 (බදුල්ල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි බදුල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක බී/ඒසීකිව්/බීඩීඑල්/2017/125 හා 2017.05.25 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හැවලකුඹුර, හැවලකුඹුරේ පාවුලකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0152**

උතුරට: සාරිස් සිල්වා හිමිකම් කියන හැවලකුඹුර සහ දිසානායක හිමිකම් කියන වලලියද්දේකුඹුර; නැගෙනහිරට: දිසානායක හිමිකම් කියන වලලියද්දේකුඹුර සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ආර්. පකර්ඩීන් හිමිකම් කියන හැවලකුඹුර; බටහිරට: ආර්. පකර්ඩීන් සහ සාරිස් සිල්වා හිමිකම් කියන හැවලකුඹුර.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/WS/517.
2019 මාර්තු මස 28 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 330

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.